FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

## 2021 ජූලි

කලාප අංක 07


මාධ්‍යවේදී තරිඳු ජයවර්ධනට තර්ජන


මාධ්‍යවේදී කෝකිලන් දාසන් අත්අඩංගුවට ගැනීම ගැන, මානව හිමිකම් කොමිසමෙන් පරීක්ෂණයක්


විරෝධතාවල නිරත වූ ක්‍රියාකාරීන් රැසක් අත්අඩංගුවට

මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන් සම්බන්ධ කෙටි වාර්තාකරණයක් සහ ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම් කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 14ක් 2021 ජූලි මාසය තුළ නිරීක්ෂණය විය. ඉන් 11ක් නව සිදුවීම් වන අතර 3ක් පෙර සිදුවීම්වලට අදාළ වර්ධනයන්ය. නිරෝධායන නීතිය උද්ඝෝෂණ මර්දනය කිරීමේ මෙවලමක් ලෙස යොදාගැනීමේ සිදුවීම් ගණනාවක් ජූලි මුල් සති දෙක තුළ වාර්තා වූ අතර, මෙහිදී එම සිදුවීම් සමූහය අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි ප්‍රවණතාවක් ලෙස එකට සලකා බලා ඇත. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ පාර්ශ්ව මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය පළ කිරීමේ අවස්ථාවල වර්ධනයක්ද ජූලි මාසයේදී නිරීක්ෂණය විය.

සිදුවීම් දෙකකට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව පොලිස්පතිවරයා වෙත විවෘත ලිපි යොමු කළේය. අදහස් පළ කිරීමේ නිදහස මර්දනය කිරීමේ අවියක් ලෙස නිරෝධායන නීති අවභාවිත කිරීමට එරෙහිව මාධ්‍ය සංවිධාන එකතුව විසින් ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වන ලදී.

## ජූලි මාසය තුළ වාර්තා වූ සිදුවීම්

1. මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් ෆේස්බුක් සමාජජාලයේ බෙදාහරින ලද පුවතක් සම්බන්ධයෙන් නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් තර්ජනාත්මකව ප්‍රතිචාර දැක්වීම.
2. මහජනතාව වැඩි වශයෙන් ඒකරාශී වන පොදු රැස්වීම්, උද්ඝෝෂණ වැනි ක්‍රියාකාරකම් නැවත දැනුම්දෙන තුරු නොකළ යුතු බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම පරිදි පොලිස් මූලස්ථානය මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීම සහ විවිධ මහජන විරෝධතාවලදී නිරෝධායන නීති උල්ලංඝනය කිරීමේ චෝදනාව මත ක්‍රියාකාරිකයන් රැසක් අත්අඩංගුවට ගැනීම.

3. ජූලි 8 වැනිදා පාර්ලිමේන්තු වටරවුමේ පැවති විරෝධතා ව්‍යාපාරය වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන්ට පොලිසිය අවස්ථා කිහිපයකදී බාධා කිරීම

4. ප්‍රවෘත්ති කාමරවල සිදුවන ලිංගික හිරිහැර පිළිබඳ පරීක්ෂණ කඩිනම් කරන ලෙස ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සම්මේලනය (IFJ) ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.

5. දේශසීමා රහිත වාර්තාකරුවෝ (RSF) සංවිධානය විසින් එළිදක්වන ලද 'ජනමාධ්‍ය නිදහස ගොදුරට ගන්නා බිහිසුණු රාජ්‍ය නායකයන්' 37 දෙනෙකුගේ සේයාරූ එකතුවට ලංකාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ඡායාරූපයද ඇතුළත් කිරීම.

6. සිරස මාධ්‍ය ජාලයේ විකාශන බලපත්‍රය අත්හිටුවීමට ආණ්ඩුව සූදානම් වන බවට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කිරීම.

7. මඩකලපුව මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් සෙල්වකුමාර් නිලන්තන් මඩකලපුව කල්ලඩි ත්‍රස්ත විමර්ශන ඒකකය වෙත කැඳවා ප්‍රශ්න කිරීම හා ඔහුගේ පෞද්ගලික තොරතුරු හෙළි කරන ලෙස බල කිරීම.

8. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ පූර්ව කොමිෂන් සභා හෝ කමිටුවල නිර්දේශ පිළිබඳ විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාවේ අතුරු වාර්තාවක් මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි නොකළ යුතු යැයි නිර්දේශ කිරීම.

9. අධිකරණයට අපහාස කිරීමට අදාළ දඬුවම් නියම කිරීමේදී ඇතැම් අධිකරණවල බලතල නිර්වචනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අධිකරණවල ක්‍රියාපටිපාටි නියාමනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් පාඨලී චම්පික රණවක මන්ත්‍රීවරයාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

10. ජනමාධ්‍යවේදීන් තොරතුරු වාර්තාකරණයට සීමා නොවී බරපතළ සිදුවීම් සම්බන්ධයෙන් තමන් සතු තොරතුරු අදාළ නීති අංශ වෙත ලබා දිය යුතු බවට ජනමාධ්‍ය ඇමතිවරයා විසින් කරන ලද ප්‍රකාශය.

11. ෆේස්බුක් සමාජජාලය තුළ සිදු කළ පළ කිරීම් කිහිපයක් හේතුවෙන් අත්අඩංගුවට ගත් මාධ්‍යවේදී කෝකිලන් දාසන් මාස 07කට වැඩි කාලයක් තිස්සේ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් සභාව විමර්ශනයක් ආරම්භ කිරීම.

12. ෆෙස්බුක් සමාජජාලයේ පළ කළ කෙටිකතාවක් හේතුවෙන් අත්අඩංගුවට ගැනීමට එරෙහිව, ලේඛක ශක්තික සත්කුමාර විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීම.

13. මානව හිමිකම් නීතිඥ හිජාස් හිස්බුල්ලා සහ දමිළ භාෂා ගුරුවරයකු හා කවියෙකු වන අහ්නාෆ් ජසීම් අත්අඩංගුවට ගැනීම සහ අසාධාරණ ලෙස රඳවා තබා ගැනීම හෙළා දකිමින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රජාව නියෝජනය කරන අනු හය දෙනෙක් සාමූහික ප්‍රකාශයක් නිකුත් කිරීම.

14. 1983 ජූලි මාසයේදී වැලිකඩ බන්ධනාගාරයේ දෙමළ ජාතික සිරකරුවන් 53 දෙනෙකු ඝාතනය කිරීම පිළිබඳව ලියූ ලිපියක් සම්බන්ධයෙන් පොලිස් පරිගණක අපරාධ කොට්ඨාසය, මාධ්‍යවේදී නන්දන වීරරත්නගෙන් ප්‍රශ්න කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 ජූලි**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 04 |
| 02 | මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| 03 | නීතිමය කොන්දේසි | 06 |
| 04 | ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| | **එකතුව** | **14** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත්ය. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 4ක් ජූලි මාසය තුළ දී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2021 ජූලි: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 04**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | තර්ජනය කිරීම | 01 |
| 02 | සංචරණයේ සහ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය | 01 |
| 03 | මානසික බලපෑම් | 02 |
| | **එකතුව** | **04** |

1. **මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් ෆේස්බුක් සමාජජාලයේ බෙදාහරින ලද පුවතක් සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන් තර්ජනාත්මක ලෙස ප්‍රතිචාර දැක්වීම.**

මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් ජූලි 01 වැනිදා ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලයේ පළ කරන ලද ප්‍රවෘත්තියකට, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් අනියම් ආකාරයට තර්ජනාත්මක ප්‍රතිචාරයක් පළ කළේය. (අදාළ ප්‍රවෘත්තිය සඳහන් ෆේස්බුක් පෝස්ටුව)

මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් අසත්‍ය ප්‍රවෘත්ති පළ කරන ලද බවත්, ඒවාට අදාළව සොබාදහම දඬුවම් කරනු ඇති බවත් දිගින් දිගටම සඳහන් කර ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා, ප්‍රභාකරන්ට සහ අනෙකුත් අපරාධකරුවන්ට සිදුවූයේ කුමක් දැයි බලන ලෙස අවධාරණයෙන් කියා සිටී. මාධ්‍යවේදියා මෙහිදී තමන් ලියන ලද අසත්‍ය පුවත් මොනවාදැයි විමසා සිටියද, ඊට නිශ්චිත පිළිතුරක් දේශබන්දු තෙන්නකෝන් විසින් ලබා දී නැත. එක් අවස්ථාවකදී පමණක් පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් වන ප්‍රවෘත්තියක් පිළිබඳව ඔහු සඳහන් කරයි. 'පාස්කු චෝදනා එල්ලවූවන්ටත් වැටුප් වර්ධක- දේශපාලන පළිගැනීම් පොලිස් ලැයිස්තුවට කැබිනට් අනුමැතිය' යන සිරස්තලය යටතේ තරිඳු ජයවර්ධන සංස්කාරක ධුරය දරන medialk වෙබ් අඩවියේ පළ වූ එම ප්‍රවෘත්තියෙහි පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන ලෙසට ඒ පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන් සහ පොලිස් විශේෂ විමර්ශන ඒකකයෙන් නිර්දේශ කරන ලද බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාට ද වැටුප් වර්ධකයක් ලබාදීමට අනුමැතිය ලැබී ඇතැයි සඳහන් වේ. ප්‍රවෘත්තියට මූලාශ්‍ර වී ඇත්තේ 2021 ජූනි 29දා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී තරිඳු ජයවර්ධන යොමු කරන ලද ප්‍රශ්නයකට ජනමාධ්‍ය ඇමැති සහ කැබිනට් ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල විසින් ලබාදුන් පිළිතුරයි. (අදාළ පුවත)

මේ සම්බන්ධයෙන් ජූලි 2 වැනිදා පොලිස්පති චන්ද්‍රන වික්‍රමරත්න වෙත ලිපියක් යොමු කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව, අදාළ සිදුවීම පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදු කොට මාධ්‍යවේදියාගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස ඉල්ලා සිටියේය. (මූලාශ්‍රය: එම නිවේදනය)

2. **ජූලි 8 වැනිදා පාර්ලිමේන්තු වටරවුමේ පැවති විරෝධතා ව්‍යාපාරය වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන්ට පොලිසිය අවස්ථා කිහිපයකදී බාධා කිරීම**

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතට විරෝධය පළ කිරීම සඳහා ජූලි 8 වැනිදා පාර්ලිමේන්තු වටරවුම අසල පැවති විරෝධතාව වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන්ට අවස්ථා කිහිපයකදීම පොලිස් නිලධාරීන්ගෙන් බාධා එල්ල වූ බව lankaviews වෙබ් අඩවිය වාර්තා කළේය.

එක් අවස්ථාවකදී පොලිස් කාන්තාවක් විසින් වීඩියෝ කැමරාවක් තල්ලු කර දැමීමෙන් වාර්තාකරණය නවතා දැමීමට උත්සාහ කළද කැමරා ශිල්පියා විසින් ක්ෂණිකව ක්‍රියාත්මක වී කැමරාව වැටෙන්නට නොදී ආරක්ෂා කරගෙන ඇති බවත්, මෙම ක්‍රියාව සම්බන්ධයෙන් අදාළ නිලධාරිනියගෙන් කළ විමසීමේදී ඇය දිව ගොස් බස් රථයකට නැගී පලා ගිය බවත් එම පුවතේ සඳහන් වේ. මාධ්‍යවේදීන් එහි සිටි උසස් පොලිස් නිලධාරීන්ගෙන් එම සිදුවීම පිළිබඳව විමසා සිටි විට කිසිදු සාධාරණ මැදිහත්වීමක් දක්නට නොලැබුණු බවත්, එම තල්ලු කර දැමීම සිතා මතා කළ දෙයක් නොව නිලධාරිනියට 'වැරදීමක්' වන්නට ඇතැයි එක් නිලධාරියකු පැවසූ බවත් එම පුවත වැඩිදුරටත් සඳහන් කරයි. (මූලාශ්‍රය: https://bit.ly/3dTigbd) මෙම තොරතුරු සනාථ කරන වීඩියෝවක් Voicetube.lk යූ ටියුබ් නාලිකාව මගින් පළ කොට තිබිණි. (https://youtu.be/yiFZQ4eWSCU) කෙසේ වෙතත් සිද්ධියට මුහුණ පෑ මාධ්‍යවේදීන් ඒ පිළිබඳව ඉන් ඔබ්බට පියවරක් ගෙන ඇති බව නිරීක්ෂණය නොවීය.

3. **මඩකලපුව මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් සෙල්වකුමාර් නිලන්තන් මඩකලපුව කල්ලඩි ත්‍රස්ත විමර්ශන ඒකකය වෙත කැඳවා ප්‍රශ්න කිරීම හා ඔහුගේ පෞද්ගලික තොරතුරු හෙළි කරන ලෙස බල කිරීම.**

මඩකලපුව මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් සෙල්වකුමාර් නිලන්තන් ජූලි 12 වැනිදා කල්ලඩි ත්‍රස්ත විමර්ශන ඒකකය (TID) වෙත කැඳවා පැය 3කට අධික

කාලයක් දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමට ලක් කර තිබේ. මෙසේ ප්‍රශ්න කිරීමට පාදක වූ නිශ්චිත හේතුවක් පැහැදිලි කර නැත. ඔහුගේ සමස්ත ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රශ්න කොට ඔහුගේ බැංකු ගිණුම්වල තොරතුරු ඉල්ලා ඇති අතර ඊමේල් හා සමාජමාධ්‍ය සබඳතාවල මුර පද හෙළි කරන ලෙස බල කර ඇත. වැඩිපුරම ප්‍රශ්න කොට ඇත්තේ එල්ටීටීඊ සංවිධානය සමඟ ඔහුට සම්බන්ධයක් තිබේද යන කාරණය පිළිබඳවය. අවශ්‍ය වුවහොත් නැවත ප්‍රශ්න කිරීම සඳහා කැඳවීමට සිදු වනු ඇති බවද ඔහුට දැනුම් දී තිබේ.

මේ පිළිබඳව පොලිස්පතිවරයා වෙත ලිපියක් යොමු කරන මාධ්‍ය සංවිධාන එකතුව, කිසියම් පැමිණිල්ලක් හෝ වෙනත් හේතුවක් මත මාධ්‍යවේදියකු සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ අතිශය පෞද්ගලික තොරතුරු ලබා දෙන ලෙස බලපෑම් කිරීම නීත්‍යානුකූල නොවන බව අවධාරණය කළේය. එමෙන්ම අදාළ සිදුවීම පිළිබඳව වහා මැදිහත්ව විමසා බලා මාධ්‍යවේදීන්ට සිදු වන මෙවැනි බාධා වැළැක්වීමට පියවර ගන්නා ලෙසද තරයේ ඉල්ලා සිටින ලදි. (මූලාශ්‍රය: එම නිවේදනය)

4. **1983 ජූලි මාසයේදී වැලිකඩ බන්ධනාගාරයේ දෙමළ ජාතික සිරකරුවන් 53 දෙනෙකු ඝාතනය කිරීම පිළිබඳව ලියූ ලිපියක් සම්බන්ධයෙන් පොලිස් පරිගණක අපරාධ කොට්ඨාසය, මාධ්‍යවේදී නන්දන වීරරත්නගෙන් ප්‍රශ්න කිරීම.**

   නිදහස් මාධ්‍යවේදී නන්දන වීරරත්නට ජූලි 30 වැනිදා උදේ 9.00ට රහස් පොලිස් මූලස්ථානයේ පරිගණක අපරාධ විමර්ශන අංශයේ පෙනී සිටින ලෙස 27 වැනිදා සවස පොලිසිය මගින් දැනුම් දී තිබේ. අදාළ පණිවුඩය සහිත පත්‍රිකාවේ සඳහන් වූ දුරකථන අංකයට කතා කොට පරීක්ෂණය කවර කරුණක් සම්බන්ධයෙන්දැයි විමසූ විට ඇමතුමට පිළිතුරු දුන් නිලධාරියා ඒ පිළිබඳව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. දැනුම් දීමට අනුව ජූලි 30 වැනිදා අපරාධ අංශයෙහි පෙනී සිටි විට, 1983 ජූලි මස 25 සහ 27 යන දිනවල වැලිකඩ හිරගෙදරදී දෙමළ සිරකරුවන් 53 මරා දැමීම ගැන පරීක්ෂණ ඉල්ලමින් ලියූ වාර්තා පිටපත් සහ එහි ඇතැම් සැකකරුවන් නම් කරමින් ලියූ සටහන් මාධ්‍යවේදියා වෙත ඉදිරිපත් කර ඇති අතර ඔහු ඒවා තමන් විසින් ලියන ලද බව තහවුරු කොට අත්සන් තබා ඇත. මාධ්‍යවේදියාට එහිදී දැනගන්නට ලැබී ඇති පරිදි එම වාර්තා රහස් පොලිසියට පැමිණිල්ලක් හැටියට ඉදිරිපත් කර ඇත්තේ එවකට වැලිකඩ බන්ධනාගාරයේ සිරඹුවමක් විඳිමින් සිටි සේපාල ඒකනායක ඇතුළු කණ්ඩායමකි.

   තමන් විසින් ලබා දුන් කටඋත්තරයේ අන්තර්ගතය පිළිබඳව නන්දන වීරරත්න සිය ෆේස්බුක් ගිණුමේ සටහනක් තබා ඇති අතර එහි මෙසේ සඳහන් වෙයි.

   "1998 මා බිබීසී ලෝක සේවයේ සේවය කරමින් සිටිද්දී මේ අපරාධයේ ඇසින් දුටු සාක්ෂිවලින් වැඩසටහන් පෙළක් සම්පාදනය කළෙමි. එහි එක් සාක්ෂිකරුවකු වූ ඥානසේකරන් මේ සමූහ ඝාතනයේ ප්‍රධාන නායකයකු හැටියට සේපාල ඒකනායක සහ ඔහුගේ අනුගාමිකයන් නම් කළේ ය. මහාචාර්ය රාජන් හූල් ලියූ කෘතිවල ද මේ අපරාධ නායකයන්ගේ නම් සඳහන් ව තිබේ. වැලිකඩදී මරා දැමුණු සිරකරුවන්ගේ මළ සිරුරු මේ අපරාධකරුවන්ගෙන් මුදවා ගැනීමට ගිය එවකට කොමාන්ඩෝ රෙජිමේන්තුවේ කර්නල් සුනිල් පීරිස් ද මේ අපරාධයේ නායකයන්ගේ ම්ලේච්ඡ හැසිරීම වාර්තා කර තිබේ. මේ නිසා මේ සාහසික අපරාධයේ වැරදිකරුවන් නම් කරන තෙක් අප මේ ගැන ලිවීම අත් හරින්නේ නැත. වසර 5 කට ආසන්න කාලයක් තිස්සේ මේ ඝාතනය ගැන කෙරෙන වාර්තා චිත්‍රපටයට අදාළ ගවේෂණයේ යෙදෙමින් සිටිමි. ඉදිරියට ද එම කට යුතු කරගෙන යමි. (මූලාශ්‍රය:https://www.facebook.com/650281772/posts/10158867902471773/)

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**මාධ්‍යයේ ස්වාධීනත්වය යනු මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය ආයතන තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය, කර්තෘමණ්ඩල ස්වාධීනත්වය, දේශපාලනඥයින්ගේ, ව්‍යාපාරික බලවතුන්ගේ සහ ආගමික ප්‍රජාවගේ බලපෑම්වලින් මාධ්‍යයේ ස්වාධීනත්වය, වෙළඳ දැන්වීම් ලබා දීමෙන් හෝ නොදීමෙන්, දූෂණ මගින් හෝ සහනාධාර මගින් මාධ්‍යයේ අන්තර්ගතයට බලපෑම් කිරීම, අන්තර්ජාල පහසුකම් හෝ බලපත්‍ර සපයන්නා මගින් මාධ්‍යයේ අන්තර්ගතයට බලපෑම් කිරීමේ උත්සාහයන් එම සංරචකයට අදාළව සලකා බැලෙන දර්ශකවලට අයත් වේ. සිරස මාධ්‍ය ජාලයේ විකාශන බලපත්‍රය අත්හිටුවීම පිළිබඳ වාර්තා වූ කරුණ මෙයින් දර්ශක දෙකක් ආවරණය කරන බව නිරීක්ෂණය විය.**

**3 වගුව: 2021 ජූලි: මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 01**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | දේශපාලනඥයින්ගේ පීඩනයෙන් මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| | **එකතුව** | **01** |

1. **සිරස මාධ්‍ය ජාලයේ විකාශන බලපත්‍රය අත්හිටුවීමට ආණ්ඩුව සූදානම් වන බවට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කිරීම.**

සිරස රූපවාහිනී නාලිකාවේ විකාශන බලපත්‍රය අත්හිටුවීම සඳහා රජයේ ඉහළ පෙළේ කණ්ඩායමක් කුමන්ත්‍රණය කරමින් සිටින බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ජූලි 7 වැනිදා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කරමින් සඳහන් කළේය. (මූලාශ්‍රය: 1. එම නිවේදනය 2. 2021 ජූලි 07 - හැන්සාඩ් වාර්තාව, තීරු 1667-1680)

රජයේ ඉහළ නිලධාරීන් සහ නීතිඥයන් කැඳවමින් මේ සම්බන්ධයෙන් සැලසුමක් සකස් කරමින් ඇති බවත් තමන් ඉතා වගකීමෙන් යුතුව මෙම ප්‍රකාශය කරන බවත් ඔහු පැවසුවේය. විපක්ෂ නායකවරයාගේ එම ප්‍රකාශයෙන් පසු විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තු සභා ගැබ මැදට පැමිණ විරෝධතාවක නිරත වූහ.

අදාළ ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින් අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා කියා සිටියේ "මේ රටේ කිසිම මාධ්‍යයක් මර්දනය කිරීම සඳහා ගෝඨාභය රාජපක්ෂ රජය යටතේ කිසිදාක, කිසියම්ම පියවරක් ගෙන නැති" බවයි.

ඉන් පසුව ජවිපෙ නායක අනුර කුමාර දිසානායකද සජිත් ප්‍රේමදාසගේ ප්‍රකාශයට සහාය පළ කරමින් කරුණු දැක්වීය. ඔහු පැවසුවේ "අද අපේ රටේ ඉන්නේ මර්දනීය හස්තයක් සහිත කළු අතීතයක් තිබෙන නායකයකු" බවයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන සමයේ මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතනවලට එරෙහිව ගෙන ගිය මර්දනීය ක්‍රියාමාර්ග පිළිබඳව ඔහු දිගින් දිගටම කරුණු දැක්වීය. (මූලාශ්‍රය: https://www.youtube.com/watch?v=26rFmYl2xks&t=697s)

බීබීසී සංදේශය වෙබ් අඩවිය මේ පිළිබඳව ජනමාධ්‍ය ඇමතිවරයාගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කර ඇත්තේ විද්‍යුත් මාධ්‍ය සංඛ්‍යාත අයිතිය ජනතාව සතු වුවත් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන පාලනය වන්නේ හාම්පුතුන්ගේ අවශ්‍යතා අනුව බවයි. "සදාචාරය හෝ විනීත බව පවතින තාක් එය හොඳයි. එහෙත් එය අභිබවා ගිය විට අදාළ පුද්ගලයන්ට අප කතා කළ යුතුයි. එක් විශේෂිත ආයතයක් පිළිබද නෙමෙයි, එහෙත් අපි අනිවාර්යයෙන්ම මේ ගැන අධ්‍යයනය කරමින් සිටිනවා." යනුවෙන් ඇමතිවරයා ප්‍රකාශ කර තිබේ. (මූලාශ්‍රය: https://www.bbc.com/sinhala/sri-lanka-57758910)

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක් ජූලි මාසය තුළ නිරීක්ෂණය විය. පුරවැසියන්ගේ සංවිධානය වීමේ හා අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි අවියක් ලෙස නිරෝධායන රෙගුලාසි අවභාවිත කිරීම පිළිබඳ සිදුවීම් රැසක් වාර්තා වූ අතර අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි ප්‍රවණතාවක් ලෙස එම සිදුවීම් මෙහිදී සමස්තයක් ලෙස සැලකිල්ලට ගන්නා ලදි. මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි යන සංරචකය යටතේ සලකා බැලෙන එක් දර්ශකයක් වන 'ජනමාධ්‍යවේදීන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාවට ගරු කිරීම' යන්න සෘජුවම නියෝජනය කරන සිදුවීමක්ද නිරීක්ෂණය විය. පෙර වාර්තාවලට ඇතුළත් වූ සිදුවීම්වලට අදාළ වර්ධනීය අවස්ථා දෙකක්ද නිරීක්ෂණය විය.**

**4 වගුව: 2021 ජූලි: නීතිමය කොන්දේසි - සිදුවීම් 06**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 03 |
| 02 | ජනමාධ්‍යවේදීන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාවට ගරු කිරීම | 01 |
| 03 | මාධ්‍යයට නීතිමය සීමා/ නීති ප්‍රතිසංස්කරණ | 02 |
| | **එකතුව** | **06** |

1. **මහජනතාව වැඩි වශයෙන් ඒකරාශී වන පොදු රැස්වීම්, උද්ඝෝෂණ වැනි ක්‍රියාකාරකම් නැවත දැනුම්දෙන තුරු නොකළ යුතු බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම පරිදි පොලිස් මූලස්ථානය මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීම සහ විවිධ මහජන විරෝධතාවලදී නිරෝධායන නීති උල්ලංඝනය කිරීමේ චෝදනාව මත ක්‍රියාකාරිකයන් රැසක් අත්අඩංගුවට ගැනීම.**

'සෞඛ්‍යමය අවදානමක් ඇති කරවමින් විවිධ උද්ඝෝෂණ පැවැත්වීම පිළිබඳව' යන සිරස්තලයෙන් යුතු මාධ්‍ය නිවේදනයක් 2021-07-06 වැනිදා පොලිස් මූලස්ථානය විසින් නිකුත් කෙරිණි. එහි සඳහන් වූයේ 'මහජනතාව වැඩි වශයෙන් ඒකරාශී වන පොදු රැස්වීම්, උද්ඝෝෂණ වැනි ක්‍රියාකාරකම් හේතුවෙන් කොවිඩ් රෝගය පැතිර යෑමේ විශාල අවදානමක් පවතින බැවින් නැවත දැනුම්දෙන තුරු ඒවැනි ක්‍රියාකාරකම් නොකළ යුතු බවට'

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පොලිස්පතිවරයා වෙත දැනුම් දී ඇති බවයි. ඉහත නිරෝධායන නියෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියා කරනු ඇති බවද එම නිවේදනයේ දැක්වේ.

මෙම නිවේදනය නිකුත් කළ දාට පසුවදා සිටම පොලිසිය විවිධ ස්ථානවල පැවති උද්ඝෝෂණවලදී නිරෝධායන නීති උල්ලංඝනය කිරීමේ චෝදනාව මත ඒවාට සහභාගී වූ පිරිස් අත්අඩංගුවට ගැනීම ආරම්භ කළේය. ජූලි 07-08 දෙදින තුළ බොරලන්ද, මුතුරාජවෙල (බෝපිටිය), කළුතර, කොළඹ ඉංජිනේරු සංස්ථාව සහ පාර්ලිමේන්තු වටරවුම යන ස්ථාවනල පැවති උද්ඝෝෂණ හේතුවෙන් ක්‍රියාකාරිකයන් 50 දෙනෙකුට අධික පිරිසක් අත්අඩංගුවට ගන්නා ලදි. ජූලි 08 වැනිදා පාර්ලිමේන්තු වටරවුමේ පැවති උද්ඝෝෂණයේදී අත්අඩංගුවට ගැනුණු ගුරු සංගම් නායක ජෝසප් ස්ටාලින් ඇතුළු 31 දෙනෙකු දින 14ක කාලයක් සඳහා නිරෝධායනයට යොමු කරන ලෙස පොලිසිය අධිකරණයෙන් ඉල්ලා සිටි නමුත් අධිකරණය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. පසුව අධිකරණ භූමියේදීම ඔවුන් බලහත්කාරයෙන් නැවත පොලිස් භාරයට ගෙන නිරෝධායනය සඳහා යොමු කෙරිණි.

පොලිසියේ මෙම ක්‍රියාකලාපය අදහස් පළ කිරීමේ නිදහස ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වවල දැඩි විරෝධයට හේතු වූ අතර ජූලි 09 වැනිදා ශ්‍රී ලංකා නීතිඥ සංගමය පොලිස්පතිවරයා සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පොදු ලිපියක් යොමු කරමින් අවධාරණය කළේ, නිරෝධායන නීතිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා යොදා නොගත යුතු බවයි.

කොවිඩ් 19 නිරෝධායන මාර්ගෝපදේශවලට මුවා වී සිදු වෙමින් පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුවේ විරෝධය සහ ස්ථාවරය පළ කරන මාධ්‍ය සාකච්ඡාවක් ජූලි මස 12 වැනිදා ශ්‍රී ලංකා පුවත් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මාධ්‍ය සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන 45ක් අත්සන් කළ පොදු නිවේදනයක්ද නිකුත් කරනු ලැබිණ.

2. **'මානව හිමිකම් පිළිබඳ පූර්ව කොමිසම් සහ කමිටුවල තීරණ ඇගයීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම' සිය අතුරු වාර්තාවක් මගින්' ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි නොකළ යුතු යැයි නිර්දේශ කිරීම.**

මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා මත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කිරීමේ ඉල්ලීමට තම කොමිසම එකඟ නොවන බව 'මානව හිමිකම් පිළිබඳ පූර්ව කොමිසම් සහ කමිටුවල තීරණ ඇගයීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම' (The Presidential Commission of Inquiry for Appraisal of the Findings of Previous Commissions and Committees on Human Rights) අතුරු වාර්තාවක් මගින් කියා සිටී. එම අතුරු වාර්තාව ජූලි 20 වැනිදා ජනාධිපතිවරයා වෙත භාර දුන්නේය.

එක්සත් රාජධානිය ඇතුළු වෙනත් රටවල ත්‍රස්තවාදය වැළැක්වීමට එරෙහි නීතිවලට අනුකූලව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කළ යුතු යැයි වාර්තාව අවධාරණය කර ඇති බවත් එය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිය අතුරු වාර්තාවේ ප්‍රධාන නිර්දේශ තුනක් ඉදිරිපත් කර ඇති බවත් ජනාධිපති මාධ්‍ය අංශය සඳහන් කරයි. පනතේ 9 වන වගන්තිය මගින් රැඳවුම් නියෝග ක්‍රියාත්මක කිරීමේදී අවම මාස 3ක් හෝ ඊට වැඩි කාලයක් රඳවා තබාගන්නා පුද්ගලයන්ට අධිචෝදනා ගොනු කර නඩු අසා නිම කිරීම, 11වන වගන්තිය යටතේ වූ රැඳවුම්කරුවන් බන්ධනාගාරවල රඳවා තබා ගැනීම වෙනුවට විශේෂ ආරක්ෂාව යටතේ සිය නිවසේ හෝ ගම් ප්‍රදේශය තුළ රඳවා තැබීම, 13වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයාට උපදෙස් දීමට අවම වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත සියලු ජාතීන් නියෝජනය කරන උපදේශක සභාවක් පත් කිරීම එම නිර්දේශ වෙයි. කොමිෂන් සභාවේ අවසන් වාර්තාව ඉදිරි මාස හය තුළ භාර දීමට නියමිතය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාධ්‍යවේදීන්, ලේඛකයන් සහ විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම වර්තමානය දක්වාම සිදු වෙමින් පවතින අතර ඒ යටතේ විවිධ මර්දනකාරී විධිවිධාන පැනවීම මෑතකදීත් සිදු විය. මෙම පනත සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු බව ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන රැසක ස්ථාවරයයි.

3. **අධිකරණයට අපහාස කිරීමට අදාළ දඬුවම් නියම කිරීමේදී ඇතැම් අධිකරණවල බලතල නිර්වචනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අධිකරණවල ක්‍රියාපටිපාටි නියාමනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් පාඨලී චම්පික රණවක මන්ත්‍රීවරයාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.**

ඉහත කටුම්පත ජූලි 9 වැනිදා ගැසට් පත්‍රයෙහි පළ කොට තිබේ. ලංකාවේ අධිකරණ අපහාසය පිළිබඳ පැහැදිලි නිර්වචනයක් හෝ දඬුවම් නියම කිරීමේ විධිමත් ක්‍රියා පටිපාටියක් නොමැති වීමේ ගැටලුව ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන විසින් කලක සිට පෙන්වා දී ඇති අතර අදහස් පළ කිරීමේ නිදහසට හා ජනමාධ්‍ය නිදහසට බාධාවක් ලෙසද එය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා නීති කොමිසම විසින් 2008 දී ඒ පිළිබඳ නීති කෙටුම්පතක් සම්පාදනය කරන ලද නමුත් ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නොලැබුණි.

අධිකරණයට අපහාස කිරීම නිසි ලෙස අර්ථ නිරූපනය කරන නීතියක් සම්පාදනය කරන ලෙස ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය හරහා ශ්‍රී ලංකා කර්තෘවරුන්ගේ සංසදය 2021 මාර්තු මාසයේදී අධිකරණ අමාත්‍යවරයාට ලිපියක් යොමු කරමින් ඉල්ලා සිටියේය. ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර්ගේ සභාපතීත්වයෙන් 2003 වසරේ

දී පැවති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ඉදිරිපත් කළ යෝජනා පදනම් කරගනිමින් මෙම යෝජනා ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදේශක කමිටුව විසින් 2006 දී සකස් කරන ලද අධිකරණයට අපහාස කිරීම පිළිබඳ පනත් කෙටුම්පතද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් අධිකරණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදි. (මූලාශ්‍රය:http://www.fmmsrilanka.lk/wp-content/uploads/2021/04/MFRMD_Mar_Sin.pdf)

4. **ජනමාධ්‍යවේදීන් තොරතුරු වාර්තාකරණයට සීමා නොවී බරපතළ සිදුවීම් සම්බන්ධයෙන් තමන් සතු තොරතුරු අදාළ නීති අංශ වෙත ලබා දිය යුතු බවට ජනමාධ්‍ය ඇමතිවරයා විසින් කරන ලද ප්‍රකාශය.**

ජනමාධ්‍යවේදීන්ගේ කාර්යය බරපතළ සිදුවීම් පිළිබඳ තම මාධ්‍ය ඔස්සේ වාර්තා කිරීම පමණක් නොවන බවත්, තමන් සතු තොරතුරු අදාළ නීති අංශ වෙත ලබාදීමේ යුතුකමක් හා වගකීමක් ජනමාධ්‍යවේදීන්ට ඇති බවත් ජනමාධ්‍ය ඇමති, කැබිනට් මාධ්‍ය ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල ජුලි 19 වැනිදා ස්වර්ණවාහිනියේ ‘ඉර-හරි කෙළින්’ සංවාද වැඩසටහනට සහභාගී වෙමින් ප්‍රකාශ කළේය. ඇමතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේ එසේ නොකිරීම සාක්ෂි වසංකිරීමේ වරද යටතට ගැනෙන බවයි. (මූලාශ්‍රය: https://www.youtube.com/watch?v=UnUzpDmNTOM)

මෙය ජනමාධ්‍යවේදීන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාව පිළිබඳ බරපතළ ගැටලු ඇති කරන ප්‍රකාශයක් වන අතර ජනමාධ්‍යවේදීන්ගේ කාර්යභාරය පිළිබඳ විකෘති අර්ථකථනයක්ද වෙයි. අදාළ වැඩසටහනේ ප්‍රශ්න විචාරකයින් ලෙස සහභාගී වූ මාධ්‍යවේදීන් මූලාශ්‍රවල ආරක්ෂාව පිළිබඳ කාරණය මෙහිදී මතු කළ නමුත් ප්‍රමාණවත් සාකච්ඡාවක් සිදු නොවූ බව නිරීක්ෂණය විය. වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයකු වන සනත් බාලසූරිය මේ පිළිබඳ තියුණු ප්‍රතිචාරයක් සිය ෆේස්බුක් ගිණුම ඔස්සේ පළ කර ඇති අතර එය පදනම් කරගෙන ජනමාධ්‍යවේදීන් අතර සංවාදයක් ගොඩනැගිණි. (මූලාශ්‍රය: https://mobile.facebook.com/story.php?story_fbid=1022708686778 1583&id=1352747725)

## පෙර සිදුවීම්වලට අදාළ වර්ධනයන්

5. **ෆේස්බුක් මාධ්‍යජාලය තුළ සිදු කළ පළ කිරීම් කිහිපයක් හේතුවෙන් අත්අඩංගුවට ගත් මාධ්‍යවේදී කෝකිලන්දාසන් මාස 07කට වැඩි කාලයක් තිස්සේ රඳවා තබාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විමර්ශනයක් ආරම්භ කිරීම.**

ෆේස්බුක් සමාජජාලයේ සිදු කළ පළ කිරීම් මගින් එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය කිරීමේ චෝදනාව මත 2020 නොවැම්බර් 28 වැනිදා වාලච්චේන පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුණු නිදහස් මාධ්‍යවේදියකු වන කෝකිලන් දාසන් මාස 7කට වැඩි කාලයක් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් නීතිඥ සංජය විල්සන් ජයසේකර ජුලි 12 වැනිදා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළේය.

මානව හිමිකම් කොමිසම ඒ පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කළ අතර ජුලි 30 වැනිදා වාලච්චේන පොලිසිය විමර්ශනය සඳහා කැඳවා තිබිණි. එහිදී කෝකිලන් දාසන් අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතු සනාථ කිරීමට පොලිසිය අපොහොසත් වූ බවත්, සාධාරණ අත්අඩංගුවට ගැනීමක් සඳහා වූ සාක්ෂි ඉදිරිපත් කිරීමට කොමිසම සති දෙකක කාලයක් ලබා දුන් බවත් නීතිඥ ජයසේකර ප්‍රකාශ කරයි. (මූලාශ්‍රය: https://twitter.com/sanjayawilson/status/1415499644453277696)

6. **ෆේස්බුක් සමාජජාලයේ පළ කළ කෙටිකතාවක් හේතුවෙන් අත්අඩංගුවට ගැනීමට එරෙහිව, ලේඛක ශක්තික සත්කුමාර විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීම.**

ෆේස්බුක් සමාජජාලයේ පළ කළ ‘අර්ධ’ නැමති කෙටි කතාව මගින් ආගමික අපහාසයක් සිදු කළේය යන චෝදනාව මත පොල්ගහවෙල පොලිසිය මගින් ICCPR පනත යටතේ අත්අඩංගුවට ගැනීමට එරෙහිව ලේඛක ශක්තික සත්කුමාර විසින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම (SCFR 167/2019) ජුලි 15 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ කැඳවූ අතර වැඩිදුර නඩු විභාගය ඔක්තෝබර් 26 වැනිදාට කල් තැබිණි. පොල්ගහවෙල පොලිස් ස්ථානාධිපතිවරයා, හිටපු පොලිස්පතිවරයා සහ නීතිපතිවරයා මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත.

ශක්තික සත්කුමාර 2019 අප්‍රේල් 01 වැනිදා අත්අඩංගුවට ගැනුණු අතර ඔහුට ඇප ලබා ගත හැකි වූයේ 2019 අගෝස්තු මස 08 වැනිදාය. ඔහුට දින 130ක් රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින්නට සිදු විය. නඩු නිමිත්තක් නොමැති බවට නීතිපතිවරයා විසින් පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයට කළ දැනුම්දීම අනුව 2020 පෙබරවාරි මස 09 වැනිදා ශක්තික සත්කුමාරගේ නඩු කටයුතු අවසන් කොට ඔහු නිදොස් කොට නිදහස් කෙරිණි.

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන තවත් වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් දෙකක් ජූලි මාසය තුළ දී නිරීක්ෂණය විය.**

**5 වගුව: 2021 ජූලි : ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| | **එකතුව** | **03** |

1. **ප්‍රවෘත්ති කාමරවල සිදුවන ලිංගික හිරිහැර පිළිබඳ පරීක්ෂණ කඩිනම් කරන ලෙස ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සම්මේලනය (IFJ) ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.**

   ප්‍රවෘත්ති කාමරවල සිදුවන ලිංගික හිරිහැර පිළිබඳ පරීක්ෂණ කඩිනම් කරන ලෙස ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය (IFJ) එහි ශ්‍රී ලංකාවේ සාමාජිකයින් සමඟ එක්ව ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය IFJ හි ශ්‍රී ලාංකීය සාමාජිකයන් වේ.

   ජූනි මාසයේදී මාධ්‍යවේදිනියන් කිහිපදෙනෙකු ට්විටර් ඔස්සේ සිය අත්දැකීම් හෙළි කිරීමෙන් පසුව මාධ්‍ය ක්ෂේත්‍රය තුළ ඒ පිළිබඳ සංවාදයක් ඇති වූ අතර ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ජනමාධ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ල, ජනමාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු ලෙස ප්‍රකාශ කළේය. පසුව ඇමතිවරයා පැවසුවේ අදාළ මාධ්‍යවේදිනියන්ගේ විධිමත් පැමිණිල්ලක් නොමැතිව පරීක්ෂණයක් සිදු කිරීමේ හැකියාවක් නැති බවයි. මේ හේතුවෙන් අදාළ සිදුවීම් යටපත් වන තත්ත්වයක් මතුව තිබේ.

2. **දේශසීමා රහිත වාර්තාකරුවෝ (RSF) සංවිධානය විසින් එළිදක්වන ලද 'ජනමාධ්‍ය නිදහස ගොදුරට ගන්නා රාජ්‍ය නායකයන්' 37 දෙනෙකුගේ සේයාරූ අතරට ලංකාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ඡායාරූපයද ඇතුළත් කිරීම.**

   දේශසීමා රහිත වාර්තාකරුවෝ (RSF) සංවිධානය වසර 5කට වරක් එළිදක්වන 'ජනමාධ්‍ය නිදහස ගොදුරට ගන්නා බිහිසුණු රාජ්‍ය නායකයන්ගේ' (Predators of press freedom) ඡායාරූපයේ නවතම එළිදැක්වීම ජූලි මාසයේදී සිදු කෙරුණු අතර ලංකාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ඡායාරූපයද ඊට ඇතුළත්ව තිබේ. මෙම ඡායාරූපයෙහි මාධ්‍ය නිදහසට වැඩිම තර්ජන එල්ල කරන ලෝකයේ රාජ්‍ය නායකයන් 37 දෙනෙකු ඇතුළත් වන අතර ඊජිප්තුව, බෙලරූස්, ඉරානය, සිරියාව, හොංකොං, නිකරගුවා, තජිකස්තානය, ශ්‍රී ලංකාව, තුර්ක්මෙනිස්තානය, බහරේන්, කාම්බෝජය, අසර්බයිජානය, පකිස්තානය, ජිබුටි, එරිත්‍රියාව, බ්‍රසීලය, උතුරු කොරියාව, සිංගප්පූරුව, කියුබාව, මියන්මාරය, සවුදි අරාබිය, ඉන්දියාව, වෙනිසියුලාව, වියට්නාමය, කැමරන්, රුවන්ඩාව, තායිලන්තය, රුසියාව, තුර්කිය, පිලිපීනය, දකුණු සුඩානය, බංග්ලාදේශය, නිරක්ෂ ගිනියා, හංගේරියා, චීනය, උගන්ඩාව යන රටවල රාජ්‍ය නායකයෝ මෙම මාධ්‍ය විලෝපීන්ගේ ලැයිස්තුවේ සිටිති. (මූලාශ්‍රය:https://rsf.org/en/news/rsfs-2021-press-freedom-predators-gallery-old-tyrants-two-women-and-european)

   මෙම ඡායාරූපය සමඟ එළිදක්වා ඇති වාර්තාව මගින් අදාළ රාජ්‍ය නායකයින් පිළිබඳ වෙන වෙනම කරුණු දක්වා ඇත. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පිළිබඳ සටහනෙහි දැක්වෙන්නේ '2019 නොවැම්බරයේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ලෙස තේරී පත් වීම, ශ්‍රී ලංකාව එහි මෑත ඉතිහාසයේ අඳුරුතම පැය කරා ආපසු පැමිණීමක් බව' යි. 2005-2015 වකවානුවෙහි මාධ්‍යයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් දණ්ඩමුක්තිය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව සිහිපත් කරන එම වාර්තාව, ආර්එස්එෆ් ගණන් බැලීම්වලට අනුව ඔහු ආරක්ෂක ලේකම්ව සිටියදී අවම වශයෙන් මාධ්‍යවේදීන් 14 දෙනෙකු ඝාතනය කර හෝ අතුරුදහන් කර තිබෙන බවත් තවත් 20 දෙනෙකු පමණ වධහිංසා පැමිණවීමෙන් හෝ මරණ තර්ජනය කිරීමෙන් පසු රට හැර ගොස් ඇති බවත් සඳහන් කරයි.

   එම වාර්තාව වැඩිදුරටත් සිහිපත් කරන්නේ, ජනමාධ්‍ය නිදහස පිළිබඳ ලෝක දර්ශකයේ රටවල් 180ක් අතරින් ලංකාව 127 වන ස්ථානයේ පසු වන බවයි.

3. **මානව හිමිකම් නීතිඥ හිජාස් හිස්බුල්ලා සහ දමිළ භාෂා ගුරුවරයකු හා කවියෙකු වන අහ්නාෆ් ජසීම් අත්අඩංගුවට ගැනීම සහ අසාධාරණ ලෙස රඳවා තබා ගැනීම හෙළා දකිමින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රජාව නියෝජනය කරන අනු හය දෙනෙක් සාමූහික ප්‍රකාශයක් නිකුත් කිරීම.**

යුක්තිය පසිඳලීම සඳහා කටයුතු කරන ආයතන පද්ධතිය පිළිබඳ ඇති විශ්වාසය තහවුරු කිරීම සඳහා ආණ්ඩුව කටයුතු කළ යුතු බවත්, අත්තනෝමතික ලෙස රඳවාගෙන සිටින හිජාස් හිස්බුල්ලා සහ අහ්නාෆ් ජසීම් නිදහස් කිරීම එහිදී තීරණාත්මක කරුණක් බවත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ප්‍රමුඛ ශාස්ත්‍රීය ප්‍රජාව මෙම සාමූහික ප්‍රකාශයෙන් අවධාරණය කර සිටී.

මෙවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා වහාම නතර කරන ලෙසත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු පීඩාකාරී නීති වහාම අවලංගු කරන ලෙසත් ආණ්ඩුවෙන් ඉල්ලා සිටින අදාළ පිරිස, වැඩිදුරටත් අවධාරණය කර සිටින්නේ ජනතාව මෙවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා වහාම නතර කරන ලෙස ආණ්ඩුවට බලපෑම් කළ යුතු බවයි. (මූලාශ්‍රය: https://newsin.asia/96-top-lankan-academics-appeal-for-the-release-of-muslim-lawyer-and-poet

**6 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි- ජූලි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව.**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - ජූනි | | 2021 ජූලි |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 24 | | 04 |
| නීතිමය කොන්දේසි | 27 | 02 | 06 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 01 | | 01 |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 | | 03 |
| | | | |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි-ජුනි දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25


Layout: iridiumcreations.com